ලංසු සඳහා ආරාධනයයි

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

මෝටර් රථ මිලදී ගැනීම

ලංසු අංකය: NTC/F&P/VEHICAL PURCHASE- 2026 - 91

1. ජාතික ගමනාගමන කොමිෂන් සභාව සඳහා, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් අලුත්ම දෙමුහුන් මෝටර් රථ දෙකක් (Hybrid Motor Cars) (02), අලුත්ම ඩබල් කැබ් රථයක් (Brand New Double Cab) (01) සහ අලුත්ම වෑන් රථ තුනක් (Brand New Vans) (03) මිලදී ගැනීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

විස්තර පහත පරිදි වේ:

අයිතමය	විස්තරය	ප්‍රමාණය	ආපසු නොගෙවන ලේඛන ගාස්තුව (රු.)	ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.)	ලංසු සුරක්ෂණයේ වලංගු දිනය
1	අලුත්ම දෙමුහුන් මෝටර් රථ (Brand New Hybrid Motor Cars) එන්ජින් ධාරිතාව 1400CC ට වැඩි	02	12,500.00	600,000.00	**2027 මාර්තු 03**
2	අලුත්ම වෑන් රථ (Brand New Vans) එන්ජින් ධාරිතාව 2500CC ට වැඩි	03	12,500.00	900,000.00	
2	අලුත්ම ඩබල් කැබ් රථ (Brand New Double Cab) එන්ජින් ධාරිතාව 2500CC ට වැඩි	01	3,500.00	300,000.00	

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබේ.

3. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට ප්‍රසම්පාදන අංශයෙන් (දුරකථන අංකය - 011 2503969) වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, **2026 ඔක්තෝබර් 12 වන දින සිට 2026 නොවැම්බර් 02 වන දින දක්වා, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා**, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05 යන ලිපිනයේ පිහිටි ප්‍රසම්පාදන අංශයේදී ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

4. එසේම උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2026 ඔක්තෝබර් 12 වන දින සිට 2026 නොවැම්බර් 02 වන දින දක්වා, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා**, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05 යන ලිපිනයේ පිහිටි අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.

5. මුද්‍රා තැබූ ලංසු කූරියර් සේවය, ලියාපදිංචි තැපෑල මගින් හෝ අතින් ගෙනවිත්, **2026 නොවැම්බර් 03 වන දින ප.ව. 2.00ට** හෝ ඊට පෙර, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05 යන ලිපිනයේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය. මුද්‍රා තැබූ ලංසුව අඩංගු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"අලුත්ම වාහන මිලදී ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

6. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීමට කැමති ලංසුකරුගේ හෝ ලංසුකරුගේ නියෝජිතයාගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

7. ලංසු **2027 පෙබරවාරි 03** වන දින දක්වා වලංගු විය යුතුය.

8. සියලුම ලංසු සමඟ ඉහත වගුවේ සඳහන් අදාළ ලංසු සුරක්ෂණය ඉදිරිපත් කළ යුතුය. එක් එක් වාහන කාණ්ඩය සඳහා වෙන වෙනම ලංසු සුරක්ෂණ ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද බැංකු සුරක්ෂණයක් (Bank Guarantee) විය යුතුය. එම සුරක්ෂණය සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව යන නමට නිකුත් කළ යුතුය.

9. පූර්ව ලංසු රැස්වීම (Pre-bid meeting) **2026 ඔක්තෝම්බර් 23 වන දින පෙ.ව. 10.30ට** ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

10. ජාතික ගමනාගමන කොමිෂන් සභාවට, කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර ඕනෑම අවස්ථාවක, ලංසුවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමටත්, ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීමටත්, සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමටත් අයිතිය ඇත. එමඟින් ලංසුකරුවන් වෙත කිසිදු වගකීමක් දැරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව බැඳී නොසිටියි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව,
අංක 241, උද්‍යාන පාර,
කොළඹ 05.